චක්‍රලේඛ අංක :- 33/2015

මගේ අංක :- කේ 06/02/2015,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2015.12.24 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

## 2015.12.25 වන දිනට යෙදෙන නත්තල් දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පිරිනමනු ලබන විශේෂ රාජ්‍ය සමාව

2015.12.25 වන දිනට යෙදෙන නත්තල් දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වගන්තියේ බලතල ප්‍රකාරව පහත දැක්වෙන පරිදි බන්ධනාගාර සිර දඬුවම් නියම කර ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රධානය කර ඇත.

01. බන්ධනාගාර ගතව 2015.12.25 දිනට සිර දඬුවම් විඳින සියළුම සිරකරුවන්ට ගෙවන ලද (ගතකරන ලද) වසරකට හා ඉන් කොටසකට සතිය බැගින් (දින 07ක) සමාවක් ලබාදීම.
02. දඩ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතව 2015.12.25 වන දිනට සිර දඬුවම් විඳින සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඬුවමේ ඉදිරි ශේෂය අහෝසි කිරිම.
03. වසර 10 කට වැඩි කාලයක් සිර දඬුවම් විඳිමින් සිටින 2015.12.25 වෙනි දිනට වයස අවුරුදු 70 ඉක්මවූ සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඬුවමේ ඉදිරියට ඇති ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන අංක (i) සිට (xxx) දක්වා වූ වැරදි (වගන්ති) සඳහා සිර දඬුවම් විඳින සිරකරුවන්ට ඉහත සඳහන් අංක :- 01 , 02 සහ 03 යටතේ දක්වා ඇති විශේෂ රාජ්‍ය සමාව හිමි නොවේ.

| | වරද | දණ්ඩනිති සංග්‍රහයේ වගන්ති |
|---|---|---|
| i) | නිති විරෝධී රැස්වීම | 140 සිට 142 සහ 146 |
| ii) | මංකොල්ල | 380,382 සහ 383 |
| iii) | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431,432,440,441 ගෙවල් බිඳීම, 443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| iv) | රාජ්‍ය ද්‍රෝහි ක්‍රියා | 114 - 123 |
| v) | පැහැරගෙන යාම | 354 - 360 |
| vi) | අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාල ප්‍රදර්ශණය | 286A |
| vii) | ළමුන්ට හිංසා කිරිම | 308A |
| viii) | ණය බැඳුම්කරයකට හෝ දාස භාවයට පත්කිරීම. බලහත්කාරයෙන් වැඩ ගැනිම. වහල් කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවාගැනිම. | 358A |

| | | |
|---|---|---|
| ix) | කූට්ටනය | 360 A |
| x) | ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජන ගැනීම | 360 B |
| xi) | තැනැත්තන් වෙළඳාම් කිරීම | 360 C |
| xii) | ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 360 E |
| xiii) | දූෂණය කිරීම | 364 |
| xiv) | ව්‍යාභිචාරය | 364 A |
| xv) | අස්වාභාවික ලිංගික වැරදි | 365 |
| xvi) | පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 365 A |
| xvii) | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |

xviii) අල්ලස් පනත යටතේ වැරදි කරුවන් වුවන්.

xix) 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි.

xx) ගිනි අවි ආඥා පනත යටතේ වැරදිකරුවන් වුවන්.

xxi) 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි.

xxii) 1982 අංක 24 දරණ ගුවන්යානා එරෙහි පනත යටයතේ වැරදි.

xxiii) වස , අබිං හා අන්තරායකර ඖෂධ පනත යටතේ වැරදි.

xxiv) හදිසි නීතිය යටතේ වැරදි කරුවන් වුවන්.

xxv) ආදයම් බදු නඩුවල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඬුවම් විඳින්නන්.

xxvi) රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වුවන්.

xxvii) 2006 අංක 05 දරණ නීතිවිරෝධී මුදල් රඳවාගැනීම වැලැක්වීමේ පනත යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

xxviii) 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තාකරණය යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

xxix) 2005 අංක 25 දරණ සත්‍ය වසන්කර ත්‍රස්තවාදයට මූල්‍යාධාර සැපයීමේ පනත යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

xxx) ඉහත අංක i සිට xxvi යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධ හමුදා පනත, නාවික හමුදා පනත, හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය.

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2015.12.25 වන දින වන විට බන්ධනාගාර ගතව සිර දඬුවම් විඳිමින් සිටින සිරකරුවන් හා සිරකාරියන් කෙරෙහි පමණි. මුදාහැරීම ක්‍රියාත්මක කලයුතු දිනය 2015.12.25 දින වේ.

එක් සිරකරුවකුට ඉහත සඳහන් විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.
මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව 2015.12.25 වන දින පෙ.ව. 09.00 ට පෙර දුරකථන පණිවුඩයක් හෝ ෆැක්ස් පණිවුඩයක් මගින් දැනුම් දී නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කිරීමට කටයුතු කරන්න.

එච්.එම්.එන්.සී.ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.